# ATTITUDES TOWARD WOMEN'S RIGHTS AND RESPONSIBILITIES IN KANDYAN SOCIETY THROUGH TEMPLE MURALS

LAEC Wickramarathna[1]

**Abstract**

In contemporary Sri Lankan society, which has historically been male-centric, issues concerning women's rights and responsibilities have become increasingly significant. Although the social contribution of women has grown remarkably in recent decades, questions remain as to whether these contributions are adequately recognized and whether women are granted equal status with men in achieving societal advancement. Understanding historical perspectives is essential to addressing these ongoing disparities. This study investigates the attitudes toward women's rights and responsibilities in Kandyan society during the 18th and early 19th centuries, with a particular focus on visual representations in temple mural paintings. The central research question explores how these murals reflect prevailing social views about women's roles during that period. A qualitative research methodology was employed, utilizing secondary data from books, reports, and scholarly articles written by colonial, local, and international authors. Iconology analysis was applied in the interpretation of the murals. The selected murals primarily depict religious narratives, including the Suvisi Vivarana, Jataka stories, and the Buddha Charitaya, where male figures are central. As a result, the roles of women are often marginalized. In these murals, women are typically portrayed in domestic roles-caring for children and supporting their husbands. There is little to no visual representation of women in positions of authority or involvement in governance. The artistic emphasis on male participation in religious and secular ceremonies reinforces patriarchal ideologies and limits the visibility of women's contributions to public and political life. By analyzing these mural depictions, the study sheds light on how visual culture reflected and reinforced gender norms in historical Sri Lankan society, providing a foundation for critically reassessing contemporary gender dynamics.

***Keywords:*** Social Attitudes, Women's rights and responsibilities, Kandyan Society, Temple Murals, Gender-bias discourses

---

[1]Department of Fine Arts, University of Kelaniya, Sri Lanka.

Email: erangachamar48@gmail.com https://orcid.org/0009-0005-8820-7923

Proceeding of the 3rd Desk Research Conference – DRC 2025 © 2025 by The Library, University of Kelaniya, Sri Lanka is licensed under CC BY-SA 4.0

Received date: 29.04.2025 Accepted date: 01.08.2025
Print Publishing Date: 31.10.2025 Web Publishing Date: 31.10.2025

# විහාර බිතුසිතුවම් කලාවෙන් නිරූපණය වන ස්ත්‍රිය පිළිබඳ අයිතිවාසිකම් සහ වගකීම් සම්බන්ධ මහනුවර සමාජයේ ආකල්ප

**එල්.ඒ.ඊ.සී. වික්‍රමරත්න**

## සාරසංක්ෂේපය

අතීතයේ සිට පුරුෂ කේන්ද්‍රීයව පවතින නූතන ලාංකික සමාජයෙහි කාන්තා අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ ගැටළුවල වැදගත්කම පිළිබඳ අවධානය වඩාත් වර්ධනය වෙමින් ඇත. කාන්තාවන්ගේ සමාජීය දායකත්වය පසුගිය දශකවලදී කැපී පෙනෙන වර්ධනයක් අත්පත් කර ගෙන ඇතත්, සමාජීය ප්‍රගමනයන්හිදී මෙම දායකත්වයන් ප්‍රමාණවත් පිළිගැනීමකට සහ සමානාත්මතාවකට පුරුෂයිනට සාපේක්ෂව කාන්තාවන්ට ලබාදී තිබේද යන ගැටළුව ශේෂව ඇත. වර්තමානයේ සිදුවන මෙම විෂම සැලකීම් තේරුම් ගැනීම සඳහා ඓතිහාසික දෘෂ්ටිකෝණයන්ගෙන් එය අධ්‍යයනය වැදගත් වේ. මෙම පර්යේෂණයේ දී ක්‍රි.ව. 18 සහ 19වන සියවස මුල් භාගයෙහි ස්ත්‍රියගේ අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව මහනුවර සමාජයෙහි පැවති ආකල්ප විහාර බිතුසිතුවම්වලින් නිරූපණය කර ඇති ආකාරය අධ්‍යයනය කරනු ලැබේ. කාන්තාවන්ගේ සමාජ භූමිකා පිළිබඳව උඩරට සමාජයෙහි පැතිර පැවති සමාජ දෘෂ්ටි මහනුවර සම්ප්‍රදායේ විහාර සිතුවම්වලින් නිරූපණය වන ආකාරය කෙබඳු ද යන පර්යේෂණ ගැටලුව පාදක කරගනු ලැබීය. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රම භාවිත කළ අතර ද්විතියීක දත්ත රැස් කිරීම සඳහා යටත්විජිත ලේඛකයන්, දේශීය සහ විදේශීය කතුවරු විසින් රචිත ග්‍රන්ථ, වාර්තා සහ නිබන්ධන විමර්ශනය කරනු ලැබීය. සිතුවම් විශ්ලේෂණය සඳහා රූපාර්ථවේද විශ්ලේෂණ ක්‍රමය (Iconology Analysis) භාවිත කරනු ලැබීය. මෙම තෝරාගත් සිතුවම්වලින් මූලිකව ම සූවිසි විවරණය, ජාතක කතා සහ බුද්ධ චරිතය ආදී ආගමික තේමා නිරූපණය වන අතර ඒවායෙහි ප්‍රධාන චරිතය පුරුෂ කේන්ද්‍රීය වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් කාන්තා භූමිකාවන් සිතුවම්වල නිරූපණය සීමාසහිත වී ඇත. ස්ත්‍රිය විසින් ගෘහාශ්‍රිතව දරුවන් රැකබලා ගැනීම සහ සැමියාගේ කාර්යයන්වලට උදව් කිරීම වැනි අවස්ථා බහුලව සිතුවම් කර ඇත. කාන්තාව සෘජු රාජ්‍ය පාලනයට සම්බන්ධ වීම හෝ ගෘහ මූලිකත්වය හෙබවීම වැනි කාර්යයන්වලට සම්බන්ධ නිරූපණ සිතුවම්වල අවම වේ. ආගමික හෝ ලෞකික කාර්යයන් සඳහා පුරුෂ දායකත්වය නිරූපණය තුළින් පුරුෂ කේන්ද්‍රීය දෘෂ්ටිවාද ශක්තිමත් කරන අතර කාන්තාවන්ගේ සමාජීය සහ දේශපාලනික දායකත්වය නිරූපණය සීමා වී ඇත. පුරාණ ලාංකික සමාජයෙහි පැවති ස්ත්‍රී පුරුෂ බව පදනම් වූ සම්මතයන් දෘශ්‍යය සංස්කෘතිය තුළ නිරූපිත ආකාරය අධ්‍යයනය මඟින් වර්තමානයේ පවතින ස්ත්‍රී පුරුෂ බව පදනම් සමාජ තත්ව විචාරාත්මකව තේරුම් ගැනීම සඳහා අවැසි මූලික පදනමක් බිතුසිතුවම් විශ්ලේෂණය මඟින් සපයනු ලැබේ.

***ප්‍රමුඛ පදඃ*** සමාජ ආකල්ප, ස්ත්‍රී වගකීම් සහ කාර්යයන්, උඩරට සමාජය, විහාර බිතුසිතුවම්, ස්ත්‍රී පුරුෂ සමාජ කතිකා

## හැඳින්වීම

ලාංකික සමාජය බහු සංස්කෘතික ජන සමාජයක් වුවත් සමාජයේ ආගමික, දේශපාලනික සහ සංස්කෘතික කාර්යයන්හී ප්‍රමුඛතාවය පුරුෂයින් විසින් දරනු ලැබේ. නමුත් පුරුෂ මූලිකව අතීතයේ සිට ම තිබූ අධ්‍යාපනය සහ දේශපාලනය වැනි ක්ෂේත්‍රවල ස්ත්‍රී දායකත්වය ක්‍රමිකව වර්ධනය වෙමින් පවතී. ස්ත්‍රිය සාම්ප්‍රදායික සීමාවන් අතික්‍රමණය කිරීමේදී ඔවුනට ලිංග භේද පදනම් වූ විවිධ ගැටළු සඳහා මුහුණපෑමට අතීතයේ සිට වර්තමානය දක්වා ම සිදුව ඇත. ඒ සඳහා ප්‍රමුඛව ම සමායේ ජීවත්වන පුද්ගලයින් විසින් ස්ත්‍රිය පිළිබඳව දරනු ලබන අහිතකර ආකල්ප බලකා ඇත. මෙහිදී 'සමාජ ආකල්ප' යනු කුමක් ද යන්න විමසා බැලීම වැදගත් වේ. එමඟින් මෙම අධ්‍යයනය මඟින් විමසුම් කරනු ලබන මූලික අධ්‍යයන සංකල්ප අවබෝධ කර ගැනීම පහසු වේ. කිසියම් පුද්ගලයෙකු කිසියම් දෙයක් සම්බන්ධව එල්බ සිටිනු ලබන මතය හෝ යමක් පිළිබඳව සිතනු ලබන ආකාරය ආකල්ප ලෙස හැඳින්විය හැකිය (ලියනගේ, 2015; Hawker, 2015). ආකල්ප පිළිබඳව බටහිර පර්යේෂකයින්ගේ නිර්වචන ද රාශියකි. "ආකල්ප යනු පුද්ගලයෙකු යම් වස්තුවකට හෝ අවස්ථාව තුළ ප්‍රතිචාර දැක්වීමේදී මඟ පෙන්වනු ලබන හෝ ගතික බලපෑමක් ඇති කරනු ලබන අත්දැකීම් තුළින් සංවිධානය වන මානසික හා ස්නායුමය සූදානම පිළිබඳ තත්වයකි" (Allport, 1935, as cited in Liyanage, 2015). ලියනගේ (2016) ප්‍රකාශ කරන පරිදි ආකල්ප බිහිවීම කෙරෙහි බලපාන කුඩා ම ඒකකය ලෙස අතීත අත්දැකීම් හේතු සාධක වේ. ආකල්ප යනු,"පුද්ගලයෙකු යම් දෙයක් / වස්තුවක් / තවත් පුද්ගලයෙකු /කණ්ඩායම් අවස්ථාවක් සම්බන්ධව දරනු ලබන මානසික ස්වභාවය හෙවත් ස්ථාවරයයි" (හරීජා සහ වංසවතී, n.d.).

මෙම අධ්‍යයනය මඟින් අතීත ලංකාවේ ලිංග භේද පදනම්ව මහනුවර ජන සමාජයේ ස්ත්‍රියගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව පැවති සමාජ ආකල්ප අධ්‍යයනය කරනු ලැබේ. එහිදී මහනුවර සම්ප්‍රදායේ ජාතක කතා සහ බුද්ධ චරිතය වස්තුවිෂය වූ බිතුසිතුවම්වලින් ස්ත්‍රී පුරුෂ බව පදනම්ව කාන්තාවන්ගේ සමාජ කාර්යයන් නිරූපණය කර ඇති ආකාරය අධ්‍යයනය කරනු ලැබේ. එමඟින් ස්ත්‍රිය පිළිබඳව පුරාණ ලංකාවේ පැවති සමාජ ආකල්ප බෞද්ධාගමික පසුබිම කේන්ද්‍රව දෘශ්‍යය කලාව තුළ නිරූපණය කර ඇති ආකාරය විමසන ලදී. විෂයානුබද්ධ ශාස්ත්‍රීය ලේඛනවල අන්තර්ගත තොරතුරු ද ද්විතියීක මූලාශ්‍ර ලෙස භාවිත කරන ලදී. එලෙස අනාවරණය කරගනු ලබන අතීත ලාංකික කාන්තාව පිළිබඳව වූ දත්ත පාදකව නූතන ලාංකික කාන්තාව මුහුණ දෙන සමාජ ගැටළු වඩාත් විමර්ශනාත්මකව අධ්‍යයනය සඳහා අවැසි ශක්තිමත් ශාස්ත්‍රීය පසුබිමක් නූතන පර්යේසකයින්ට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ කාන්තා අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳ ක්‍රියාකාරී සංවිධානවලට ගොඩනැංවීම සඳහා මෙම පර්යේෂණය වැදගත් වේ. මෙහිදී මිනිසාට ස්ත්‍රී පුරුෂ භේද නොසලකා

පුරුෂයිනට සමාන අයිතිවාසිකම් සහ හිමිකම් ඇති සමාජ තත්වයක් නූතන කාන්තාවට ද උදාකරලීමට අවශ්‍ය නව දැනුම සම්පාදනයට හැකිය. එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්කවල (United Nations Sustainable Development Goals - SDGs) පස්වන අරමුණ මඟින් ලිංගික සමානාත්මතාවයෙහි (Gender Equality) වැදගත්කම පෙන්වා දී ඇත. පුද්ගලයාගේ ලිංගය පදනම් නොවී සෑම පුද්ගලයෙකුට ම අයත් හිමිකම් භුක්ති විඳීමට සහ අවස්ථා ලබා ගැනීමට (opportunities) ඇති හැකියාව පිළිබඳ එහි අවධාරණය කර ඇත. පුරාණ ලංකාවේ මහනුවර සමාජයෙහි තිබූ ස්ත්‍රී පුරුෂ බව පදනම් වූ සමාජ ආකල්ප, විශ්වාස, නීති, සම්ප්‍රදායන්, සිරිත් විරිත්වල බලපෑම කාන්තාවගේ ජීවිතයට ලැබුණු ආකාරය මෙම අධ්‍යයනයේ දී විමර්ශනය කරනු ලැබේ. එක්සත් ජාතීන්ගේ ස්මාරක හා ස්ථාන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (ICOMOS) (2021) ප්‍රකාශ කරන පරිදි ඉතිහාසයේ විවිධ කාලවල දී කාන්තා සහ අනෙකුත් ලිංගවලට සම්බන්ධව සමාජයේ පිළිගැනීමට ලක් වූ සහ නොවූ චරිත (roles) සමාජයේ තිබූ බවට සංස්කෘතික උරුම ඇසුරෙන් පෙන්වා දිය හැකි ය.

කාන්තාවන්ගේ සමාජ භූමිකා පිළිබඳව උඩරට සමාජයෙහි පැතිර පැවැති සමාජ දෘෂ්ටි මහනුවර සම්ප්‍රදායේ විහාර සිතුවම්වලින් නිරූපණය වන ආකාරය කෙබඳු ද යන පර්යේෂණ ගැටලුව පාදක කරගනු ලැබීය. ක්‍රි.ව. 18 සහ 19වන සියවස මුල් භාගයට අයත් උඩරට සමාජයෙහි ලිංගභේද පදනම්ව ස්ත්‍රිය පිළිබඳව පැවති සමාජ ආකල්ප මහනුවර යුගයේ උඩරට සහ පහතරට විහාර බිතුසිතුවම් කලාවේ නිරූපණය වන ආකාරය අධ්‍යයනය පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වේ. මේ යටතේ පහත ද්විතීයික අරමුණ නිර්මාණය කර ඇත.

☞. විවිධ සමාජ කාර්යයන් සඳහා කාන්තාවන් දක්වන දායකත්වය ඇසුරින් ස්ත්‍රිය පිළිබඳව පිළිබිඹු වන සමාජ ආකල්ප විමර්ශනය කිරීමට.

**සාහිත්‍යය සමීක්ෂාව**

මහනුවර සමාජය පිළිබඳව අධ්‍යයනයේ දී යටත්විජිත යුගයේ ලංකාවේ වාසය කළ හෝ සංචාරය කළ විදේශිකයින් විසින් රචිත ලේඛන සමකාලීන සමාජ තොරතුරු නිරූපණය වන වැදගත් ද්විතීයික මූලාශ්‍රයකි. ක්‍රි.ව. 17 සහ 19වන සියවස් අතරතුර ලංකාවෙහි දීර්ඝ කාලයක් වාසය කළ විදේශීය පුද්ගලයන් රචිත ලේඛන (නොක්ස්, 1681; කෝඩිනර්, 1803; ඩේවි, 1821; ෆෝර්බ්ස්, 1841; Sirr, 1850) ඇසුරින් සමකාලීන සමාජයේ පැවති ස්ත්‍රී පුරුෂ දෘෂ්ටිවාදය පිළිබඳ සාධක හඳුනාගත හැකි ය. මෙම ලේඛකයන්ගේ පෞද්ගලික නිරීක්ෂණ ඇසුරින් සිය අදහස් ප්‍රකාශ කර තිබුණ ද පෙන්වා දෙන කරුණුවල සමාන අදහස් හඳුනාගත හැකිය. ලංකාවේ පැවති ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවයන් ඔවුන් විසින් විග්‍රහ කිරීමේදී ලංකාවේ සාමාන්‍ය පිළිගත් සම්ප්‍රදායන් වුවත් බටහිර සංස්කෘතිය සමඟ සංසන්දනය කර විශ්මයට පත්ව රචනා කර ඇත. ලංකාවේ ස්ත්‍රී පුරුෂ දෘෂ්ටිවාද පිළිබඳව කරනු ලැබූ බොහෝ පර්යේෂණවලට අදාළ තොරතුරු රැස්කිරීමේ ද්විතියික මූලාශ්‍ර ලෙස මෙම ලේඛන භාවිත කර ඇත. එබැවින් ක්‍රි.ව. 18 සහ 19වන සියවස්වල මහනුවර සමාජයේ ස්ත්‍රිය පිළිබඳව වූ ආකල්ප විමර්ශනය සඳහා කරනු ලබන මෙම පර්යේෂණයට ද ඉහත සාහිත්‍යය නිර්මාණ ද්විතියික මූලාශ්‍රයක් ලෙස භාවිත කළ හැකිය. මහනුවර රාජධානි යුගයට අයත් බිතුසිතුවම් පදනම්ව සමකාලීන සමාජ, ආර්ථික හා ආගමික තේමා පිළිබඳ විවිධ අධ්‍යයනයන් (බණ්ඩාරනායක, 1982; විජේවර්ධන, 2004; සෝමතිලක, 2004; රත්නායක, 2009; මහින්ද හිමි, 2016; ජයතිලක, 2022) සිදු කර ඇත. මෙම අධ්‍යයනයන්වලදී ලංකාවේ මහනුවර අවදියෙහි චිත්‍ර කලාවේ විකාශනය, විදේශීය ආභාසය, අමුද්‍රව්‍යය භාවිතය, තාක්ෂණික ශිල්පක්‍රම සහ උඩරට සහ පහතරට චිත්‍රවල ශෛලීය ලක්ෂණ පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇත. එයිනුත් සමකාලීන සමාජයේ ස්ත්‍රිය පිළිබඳව වූ සමාජ ආකල්ප (දෘෂ්ටිවාද) පිළිබඳ විමර්ශනය කළ සීමිත අවස්ථා කිහිපයක් ඇත. ඒ අතර කරුණාරත්නගේ පර්යේෂණ වාර්තා (2018, 2021) සහ උපාධි නිබන්ධනය (2015) ප්‍රධාන වේ. මෙහිදී ඇය ක්‍රි.ව. 18 සහ 19වන සියවස්වලට අයත් උඩරට සහ පහතරට කාන්තාවන්ගේ සමකාලීන සමාජ ජීවිතය පිළිබඳව තොරතුරු අනාවරණය කර ඇත. පශ්චාත් නිදහස් ලංකාවේ සිංහල කාන්තා ජීවිතය පිළිබඳ සිරිවර්ධන (2002) විසින් අධ්‍යයනය කර ඇත. එහිදී ලාංකික නූතන ස්ත්‍රිය පිළිබඳව ගොඩනැගී ඇති නූතන සමාජ දෘෂ්ටිය කෙරෙහි යටත්විජිතකරණය සහ ස්වදේශ ව්‍යාපාර ඇති කළ බලපෑම යම් ප්‍රමාණයකට අනාවරණය කිරීම සිදු කර ඇත. ප්‍රසන්න (2022, 2023) විසින් එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්කවලට අනුව ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර ගැනීම සඳහා ලංකාව ගත යුතු ක්‍රියාමාර්ග සහ ලංකාවේ නූතන ස්ත්‍රී පුරුෂ භූමිකාවන් පිළිබඳව පිරිමි පුද්ගලයන් විසින් දක්වනු ලබන ආකල්ප පිළිබඳව විමර්ශනය කර ඇත.

සාහිත්‍ය විමර්ශනයේදී අනාවරණය කරගත් පරිදි දැනට සිදුව ඇති බොහෝ පර්යේෂණ උඩරට සමාජයේ පැවැති ආර්ථික සහ සංස්කෘතික ක්ෂේත්‍ර පුළුල් දෘෂ්ටිකෝණයකින් අනාවරණය කර ඇත. නමුත් ලිංගභේද පදනම්ව සමාජ ආකල්ප ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව සිදුව ඇති පර්යේෂණ අවම වේ. එහිදී විහාර බිතුසිතුවම් කලාව මඟින් නිරූපණය වන ස්ත්‍රිය පිළිබඳව වන සමාජ ආකල්ප පුළුල්ව විග්‍රහ කරන ලද පර්යේෂණ පිළිබඳ හිඩැසක් පවතී. මෙම ක්ෂේත්‍රය පිළිබඳ තවදුරටත් පර්යේෂණ සිදුකිරීම මඟින් ස්ත්‍රිය පිළිබඳව වන නූතන සමාජ ආකල්ප තවදුරටත් අවබෝධ කර ගැනීමට හැකියාව ලැබේ. එබැවින් මහනුවර යුගයේ ස්ත්‍රිය විවිධ සමාජ කාර්යයන්වලට දක්වන දායකත්වය පිළිබඳව වන සමාජ ආකල්ප බිතුසිතුවම්වලින් නිරූපණය වන ආකාරය අධ්‍යයනය කරනු ලැබීය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රම භාවිත කරන ලදී. මෙහිදී ස්ත්‍රිය පිළිබඳව පැවැති සමාජ ආකල්ප අධ්‍යයනය සඳහා අවශ්‍යය දත්ත රැස්කිරීමේ දී යටත්විජිත යුගයේ විදේශීය ලේඛකයන් විසින් රචිත ග්‍රන්ථ සහ වාර්තා ද ස්ත්‍රී පුරුෂ දෘෂ්ටිවාද (Gender Ideology) පිළිබඳ රචිත මෑත කාලීන ශාස්ත්‍රීය පර්යේෂණ

ලිපි සහ වාර්තා යන ද්විතියික මූලාශ්‍ර විමර්ශනය කරන ලදී. එමෙන්ම අන්තර්ජාලයේ ප්‍රකාශයට පත් කර ඇති පිළිගත් පර්යේෂණ ප්‍රකාශන ඇතුළත් වෙබ් අඩවිවල ප්‍රකාශිත පර්යේෂණ වාර්තා ද විමර්ශනය කර ඇත. සිතුවම් නිරීක්ෂණය සඳහා තෝරාගත් උඩරට සහ පහතරට විහාරවල ක්ෂේත්‍ර අධ්‍යයනය කරන ලදී. සිතුවම්

විශ්ලේෂණය සඳහා රූපාර්ථවේද විශ්ලේෂණ ක්‍රමය (Iconography Analysis) භාවිත කරනු ලැබීය. Ecesu (2025) ප්‍රකාශ කරන පරිදි කලා ඉතිහාසඥ Erwin Panofsky විසින් රූපාර්ථවේද විශ්ලේෂණ ක්‍රමවේදය අදියර තුනක් යටතේ  විස්තර කර ඇත. පළමුව නිර්මාණයක ඇති මූලික ආකෘතිය, හැඩතල, ක්‍රියා (Actions) සහ භාව ප්‍රකාශනයන් ආදිය නරඹන්නාගේ පවතින දැනුම අනුව විස්තර කල යුතුය. දෙවනුව සාහිත්‍යයමය, ඓතිහාසික, සංස්කෘතික හෝ ආගාමික දැනුම පාදකව දකිනු ලබන සංකේත හෝ නිරූපිත කතා සහ චරිත ආදිය අර්ථකතනය කල යුතුය. තෙවනුව පුළුල් සමාජීය, දාර්ශනික හෝ මනෝවිද්‍යාත්මක ආකල්ප අනාවරණය කර ගැනීම සඳහා ආකෘතිය (form), අන්තර්ගතය සහ සංස්කෘතික සන්දර්භය සංස්ලේෂණය (synthesizing) කරනු ලැබේ. ඒ අනුව මෙම අධ්‍යයනය සඳහා පහත දැක්වෙන පර්යේෂණ ක්‍රියාවලිය (research procedure) අනුගමනය කරනු ලැබේ.

☛. ප්‍රථමයෙන් විහාර චිත්‍රවල දැකිය හැකි රූප (Icons) සහ සංකේත (Symbols) හඳුනාගනු ලැබේ.

☛☛. අනතුරුව එලෙස හඳුනා ගනු ලැබූ රූප සහ සංකේත පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍ර ඇසුරෙන් විමර්ශනය කරනු ලැබේ.

☛☛☛. ස්ත්‍රිය පිළිබඳව පවතින හෝ පැවති ආකල්ප අධ්‍යයනයේ දී බිතුසිතුවම් නිර්මාණය වූ උඩරට රාජධානි යුගය සහ යටත්විජිතකරණ අවධිය යන කාල පදනම්ව රූප භේද ලක්ෂණ විශ්ලේෂණය කරනු ලබන අතර එමඟින් සිතුවම්වලින් නිරූපණයවන සත්‍ය අදහස් (intrinsic meaning) අනාවරණය කර ගනු ලැබේ.

**පර්යේෂණයේ සීමා**

මෙම අධ්‍යයනයේදී මහනුවර යුගයේ සමාජ, ආර්ථික සහ සංස්කෘතිය පිළිබඳව විවරණය කරනු ලබන සාහිත්‍ය මූලාශ්‍ර පමණක් පදනම් කරගන්නා ලදී. එහිදී යටත්විජිත යුගයේ උඩරට වාසය කළ විදේශීය ලේඛකයන්ගේ වාර්තා ද, ස්ත්‍රී පුරුෂ දෘෂ්ටිවාද පිළිබඳව සිදු කළ මෑත කාලීන පර්යේෂණ ප්‍රකාශන ද අධ්‍යයනය කරන ලදී. මහනුවර යුගයේ විහාර බිතුසිතුවම්වලින් සමකාලීන සමාජයේ ස්වභාවය පිළිබඳව කළ පර්යේෂණ ද විමර්ශනය කර ඇත. ගෘහාශ්‍රිත කාර්යයන්, විවිධ වෘත්තීන් සහ ආගමික සහ ලෞකික උත්සව අවස්ථාවලදී කාන්තාවන් දක්වන දායකත්වය ඇසුරින් ඉස්මතුවන ස්ත්‍රිය පිළිබඳ සමාජ ආකල්ප පමණක් අධ්‍යයනය කරනු ලැබීය. මහනුවර යුගයේ උඩරට සහ පහතරට සම්ප්‍රදායන් ද්විත්වයට ම අයත් ජාතක කතා සහ බුද්ධ චරිතය නිරූපිත බිතුසිතුවම් පිළිබඳව ලියැවුණු ශාස්ත්‍රීය ප්‍රකාශන දත්ත රැස් කිරීම සඳහා අධ්‍යයනය කරනු ලැබීය.

**දෘශ්‍ය දත්ත**

මහනුවර යුගයේ උඩරට සහ පහතරට සම්ප්‍රදායට අයත් සිතුවම් නිරීක්ෂණයේ දී බෞද්ධ කතා වස්තුවල ස්ත්‍රිය ජීවිතයේ විවිධ අවස්ථාවල දියණියක, ගෘහණියක සහ මවක ලෙස විවිධ  සමාජ චරිත මඟින් නිරූපණය කර ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. පහතරට සිතුවම් සම්ප්‍රදායට අයත් කතළුව පූර්වාරාමයෙහි බුද්ධ චරිතය කතා තේමාවට අයත් සිතුවමක ගර්භනී මහමායා දේවියගේ කුස බෝසතාණන් වහන්සේ පිළිසිඳ ගත් ආකාරයත් (රූපය 01), පටාචාරා කතා වස්තුවෙහි ගර්භනී පටාචාරාවත් සිතුවම් කර ඇත (රූපය 02). එමෙන් ම මව සහ පියා යන දෙදෙනාම දරුවන් පෝෂණය කිරීමේ කාර්යයට දායකවන ආකාරය නිරූපිත ජාතක කතා සිතුවම් බහුලව හමුවේ. අරත්න රජමහා විහාරයෙහි වෙස්සන්තර ජාතකය නිරූපිත එක් සිතුවමක වෙස්සන්තර රජු සහ මන්ද්‍රි දේවියගේ උකුලේ දරුවන් දෙදෙනා වාඩිවී සිටින ආකාරය ඇඳ ඇත (රූපය 03). කැලණිය පැරණි විහාර මන්දිරයෙහි නිරූපිත එම කතා වස්තුවෙහි ම වෙස්සන්තර රජු සිය එක් දරුවෙකුට අතින් යම් ආහාරයක් කවන ආකාරය නිරූපිතය (රූපය 04). දෛනික ජීවිතයෙහි පුරුෂයින් විසින් කෘෂි කටයුතුවල නිරතවන ආකාරය දැක්වෙන සිතුවම් ද මේ අතර හමුවේ. මැදවල ටැම්පිට විහාරය හා මිනිගමුව විහාරවල උරග ජාතකය නිරූපිත චිත්‍රයෙහි බෝසතාණන් වහන්සේ කුඹුරේ නඟුලකින් සීසානු ලබන ආකාරය ඇඳ ඇත (පිළිවෙලින් රූපය 05 සහ 11). මැදවල ටැම්පිට විහාරයෙහි උරග ජාතක බිතුසිතුවමෙහි කුඹුරේ වැඩ කරන ගොවියාට කෑම රැගෙන යන නිවැසි තරුණ එක් කාන්තාවක් අත කෘෂි උපකරණයක් (රූපය 06) දක්වා ඇති අතර එමඟින් ඇය ගොවියාට අවැසි උපකරණ නිවසේ සිට රැගෙන යන ආකාරය නිරූපණය කළා විය හැකිය. කාන්තාව විසින් හුදෙක්ම ගෘහය තුළ කාර්යයන් පමණක් නොව නිවසින් බැහැරට ගොස් ආහාර පාන එක්රැස් කරන අවස්ථා ද සිතුවම් කර ඇත. විහාරවල වෙස්සන්තර ජාතකය නිරූපණය කරනු ලබන අවස්ථාවලදී මන්ද්‍රි දේවිය දරු දෙදෙනා සහ සැමියා හට එලවැල නෙලීම සඳහා වනයට පැසක් සහ කෙක්කක් රැගෙන යන ආකාරය නිරූපිත ය (රූපය 07). කාන්තාවන් සමාජයේ අවමංගල්‍යය වැනි ලෞකික උත්සව සඳහා දැක්වූ දායකත්වයෙහි ස්වභාවය සිතුවම් ඇසුරින් අධ්‍යයනය කල හැකිය. මැදවල ටැම්පිට විහාරයෙහි උරග ජාතකය නිරූපිත සිතුවමෙහි මියගිය දරුවාගේ අවමංගල්‍යය කටයුතු කාන්තා සහභාගීත්වයෙන් තොරව පියා විසින් පමණක් ඉටු කරනු ලබන ආකාරය නිරූපිත ය (රූපය 08). එමෙන්ම කතළුව නවමුණිසෑ විහාරයෙහි බුද්ධ පරිනිර්වානයෙන් පසු දේහය රැගත් පුරුෂයින් පමණක් සමන්විත පෙරහැරක් ඇඳ ඇත (රූපය 09). මෙයට අමතරව කාන්තාවන්ට මහනුවර ජන සමාජයෙහි හිමිව තිබූ කාන්තා අයිතිවාසිකම් සහ හිමිකම් අර්තකථනය කල හැකි තවත් සිතුවම් නිරීක්ෂණය කළ හැකි ය. ලෞකික උත්සව අවස්ථාවල දී විචිත්‍රවත් යුරෝපීය ඇඳුමින් සැරසී ප්‍රියසම්භාෂණ සඳහා සහභාගීවන කාන්තාවන් කතළුව පූර්වාරාමයෙහි මහදන සිටුවරයාගේ කතාවෙන් හමු වේ. එමෙන් ම සංගීත

භාණ්ඩ වයමින් විනෝදාස්වාද ක්‍රියාවල නිරතවන කාන්තාවන්ගේ නිරූපණයන් ද සිතුවම් කර ඇත. තොටගමුව තෙල්වත්ත සහ මිරිස්ස සමුද්‍රගිරි විහාරයෙහි කාන්තාවෝ රබන් වයමින් නටමින් විනෝදාස්වාද ක්‍රියාවල යෙදෙන රූප හමුවේ (රූපය 12), (රූපය 13). මෙම සිදුවීම්වලට බෙහෙවින් වෙනස් කාන්තාව පිළිබඳව සමාජ ආකල්ප නිරූපිත නිර්මාණ ද විහාර සිතුවම්වල දැකිය හැකිය. මුල්කිරිගල විහාරයේ තේලපත්ත ජාතකයෙහි බෝසතුන් පෙරහැරකින් රාජ්‍යයෙන් පිටව යන ආකාරය දැක්වෙන සිතුවමකි. මෙම පෙරහැරෙහි ගැමි ශාන්තිකර්මවල එන දහඅට පාලියෙහි අභාසයෙන් සකස් වූ ලංකාවේ දකුණු ප්‍රදේශයට ආවේණික තොවිල් සම්ප්‍රදායේ නැටුමකි (මහින්ද හිමි, 2016). මෙම නර්තනයෙහි එන කාන්තා චරිතය වෙස් මුහුණක් පැළඳගත් පුරුෂයෙකු විසින් රඟ දක්වනු ලබන ආකාරයෙන් ඇඳ ඇත.

**ප්‍රතිඵල සහ සංවාදය**

මහනුවර යුගයේ සමාජය පිළිබඳ අධ්‍යයනයේදී උඩරට සම්ප්‍රදායේ බිතුසිතුවම් සේම පහතරට සම්ප්‍රදායේ සිතුවම් ද විමර්ශනයෙන් තේමාව පිළිබඳව පුළුල් අවබෝධයක් ළඟා කර ගත හැකිය. "විහාර සිත්තරුන්ගේ ඇතැම් නිරූපණ සරල ආකෘතියක් දැක්වූ ද ඒවායින් තත්කාලීන සමාජ අර්බුද ඇතුළු සංකීර්ණ මිනිස් චර්යාවන් පිළිබඳ වැදගත් පැතිකඩ රැසක් අනාවරණය කෙරෙයි."(ජයතිලක, 2022, පිටු. 115). ලාංකික කාන්තාව පිළිබඳ මහනුවර යුගයේ පැවැති සමාජ ආකල්ප අධ්‍යයනය සඳහා සමකාලීන සාහිත්‍ය මූලාශ්‍ර ද බෙහෙවින් වැදගත් වේ. ලාංකික සමාජයෙහි ස්ත්‍රිය දියණියක්, බිරිඳක් මවක් සහ මිත්තණියක් ආදී ජීවිතයේ විවිධ අවදිවල කටයුතු කරනු ලැබේ. කරුණාරත්න (2021) ප්‍රකාශ කරන පරිදි නව පරපුරක් බිහිකිරීම සහ දරුවන් රැකබලා ගැනීමේ කාර්යය ස්ත්‍රිය ජීව විද්‍යාත්මකව ලබා ඇති කාර්යයන් වේ.

විජේසේකර (1949) ප්‍රකාශ කරන පරිදි පවුලක ස්ථාවරතාව කාන්තාව සතු වූ අතර වාර්ෂිකව දරුවන් බිහිකිරීමත්, රැක බලා ගැනීමත් ආහාර රැස් කිරීමත් ආදී කාර්යයන් විවාහක ස්ත්‍රිය විසින් සිදුකර ඇත. මහනුවර සම්ප්‍රදායේ සිතුවම්වල ස්ත්‍රියගේ ගර්භනී අවදිය ඉස්මතු කරනු ලබන බුද්ධ චරිතය ඇතුළු වෙනත් බෞද්ධ කතා රාශියකි. මහමායා දේවියගේ කුස බෝසතාණන් වහන්සේ පිළිසිඳ ගැනීම සහ පටාචාරා කතා වස්තුවෙහි ගර්භනී පටාචාරාව නිරූපණය ඒ අතර වැදගත් වේ. චිත්‍ර ශිල්පියා උදරය ඉදිරියට නෙරා පැමිණි කාන්තාවක ලෙස කාන්තා ශරීරය ඇඳ ඇත. රාජකීය ස්ත්‍රියක් වුව ද සාමාන්‍යය ස්ත්‍රියක් වුව ද මාතෘත්වය ස්ත්‍රියකට පොදු ජීව විද්‍යාත්මක දෙයක් බව සිතුවම්වලින් නිරූපණය කළා යැයි උපකල්පනය කළ හැකිය. මහමායා දේවියට පිටුපසින් අයෙකු කුඩයක් ඉහළා සිටින අතර පටාචාරාව සිය සැමියා සමඟ දක්වා ඇත. කාන්තාව මෙවැනි අවදියකදී හුදෙකලා නොකොට සෙසු අයගේ උපකාර ලැබිය යුතු අවදියක සිටිනා බව නිරූපණය එමගින් අදහස් කරන්නට ඇත.

දරුවන් රැක බලා ගැනීමේ කාර්යය සඳහා ස්ත්‍රිය පවුලක විශේෂ මෙහෙයක් සිදු කරන ලදී. මහනුවර අවදියේ සිතුවම්වලින් ස්ත්‍රිය මවක ලෙස දරුවන් පෝෂණය කිරීම (Child rearing) සහ කිරි ලබාදීම (Breastfeeding) ස්ත්‍රියකගේ ප්‍රධාන කාර්යයක් ලෙස නිරූපණය කර ඇත (කරුණාරත්න, 2021). නමුත් දරුවන් රැක බලා ගැනීමේ කාර්යය සඳහා ස්ත්‍රිය පමණක් නොව මහනුවර අවදියේ දී පුරුෂයින් ද දායක වී ඇති බව සමකාලීන සාහිත්‍යය ඇසුරෙන් හඳුනාගත හැකිය. "දරුවන් රැක බලා ගැනීම දෙමව්පියන් දෙදෙනා අතරම සමානව බෙදී ඇති අතර බොහෝ විට ළදරුවන් පියා සමඟ දැකිය හැකිය"(ඩේවි, 1821, p. 287). පවුලක කුඩා දරුවන් බලා ගැනීමේ කාර්යය ස්ත්‍රී සහ පුරුෂ හුවමාරු කාර්යයක් ලෙස බිතුසිතුවම්වල දැකිය හැකිය (කරුණාරත්න, 2021). ඒබව දෙමාපියන් දෙදෙනා ම විසින් දරුවන්ට ආහාර කැවීම සහ ඔවුන් වනයට යන විට දරුවන්ව දැතින් ඔසවාගෙන යෑම වැනි අවස්ථා නිරූපණයෙන් වඩාත් තහවුරු වේ.

මහනුවර අවධියේ දී සාමාන්‍යය ගොවි පවුලක ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්තය වූ අතර පවුලක සැමියා එම කාර්යයෙහි මූලිකත්වය ගනු ලැබීය. විහාර චිත්‍රවල කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන පුරුෂ රූප බහුලව හමුවේ. ස්ත්‍රිය කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන ආකාරයේ බිතුසිතුවම් අවම වීම විශේෂත්වයකි. මහනුවර අවදියේ දී ලිංගභේද පදනම් වූ කාර්යයන් බෙදීම බහුලව ම දැක ගත හැකි වන්නේ කෘෂිකර්මාන්තයෙහි ය (ප්‍රේමරත්න, 2022). මැදවල ටැම්පිට විහාරයෙහි උරග ජාතකයෙහි සීසාන ගොවියා (බෝසතුන්) සමඟ ඔහුගේ පුත්‍රයාව ද කුඹුර අසල පිහියක් රැගෙන යම් කාර්යයක නිරත වන ආකාරය දැක්වේ. සමකාලීන විදේශීය කතුවරුන්ගේ ලේඛන (නොක්ස්, 1681; ඩේවි, 1821) අනුව මහනුවර යුගයේ ලාංකේය කාන්තාව කෘෂිකාර්මික කටයුතු සඳහා ද සහභාගී වී ඇත. "මනාව පැසුණු පසු (තණ සහල් කරල්) ස්ත්‍රීහු මේ කරල් කඩා මලුවල බහා ගෙදරට ගෙන එති. සමහර ස්ත්‍රීන් අතින් කරල් කඩා ගන්නා අතර ඇතැමෙක් දැකැතිවලින් ඒවා කපා ගනිති" (නොක්ස්, 1681, p. 77). කරුණාරත්න (2018) ප්‍රකාශ කරන පරිදි මැදවල ටැම්පිට විහාරයෙහි උරග ජාතක බිතුසිතුවමෙහි කුඹුරට යන එක් කාන්තාවක් අත කෘෂි උපකරණයක් දැක්වීම මගින් ඇය දිවා ආහාරයෙන් පසු සැමියාගේ කෘෂි කටයුතු සඳහා උදව් කිරීමට සූදානම්ව සිටිනා බව නිරූපණය වනවා යැයි උපකල්පනය කර ඇත. මෙවැනි කරුණු මුල් ජාතක කතා විස්තරයෙහි නොමැති අතර ඒවා නිර්මාණකරු අවශ්‍ය පරිදි කතාවට අලුතින් එකතු කරන ලද අංග වේ (කරුණාරත්න, 2018). නිවැසි කාන්තාවන් ගෘහයේ වැඩ අවසන් වූ පසු ඉතිරි කාලයේ සිය ස්වාමියාට හෝ පියාට උදව් කිරීම සඳහා කෘෂි කටයුතුවලට සහභාගී වන බව පෙන්වීමට චිත්‍ර ශිල්පියාට අවශ්‍ය වුවා විය හැකිය. ස්ත්‍රියක් බිරිඳක වශයෙන් ස්වාමියා වැඩ කරන ස්ථානයට ආහාර රැගෙන යෑම ඇයගේ දෛනික ජීවිතයේ කාර්යයක් වුවා විය හැකිය. මැදවල සහ මිනිගමුව ටැම්පිට විහාරස්ථාන ද්විත්වයෙහි ම උරග ජාතකයෙහි මෙම සිද්ධිය සිතුවම් කර ඇත. නොක්ස් (1681) ප්‍රකාශ කරන පරිදි නිවසක කාන්තාවෝ විසින් කැලේට ගොස් දර කැඩීම, පලා නෙළීම, හවසට හරකුන් දක්වා ගෙන ඒම සහ වී කෙටීම නිවසේ ස්ත්‍රියකට පැවරුණු සෙසු කාර්යයන් වේ. වෙස්සන්තර ජාතකයෙහි සිතුවම්වල නිරූපිත මන්ද්‍රි දේවියහට

එලවැල නෙලීම සඳහා වනයට පැසක් සහ කෙක්කක් රැගෙන යාමට සිදුවනුයේ ඇයි ද යන්න විමසිය යුතුය. වෙස්සන්තර රජු තපස් රැකීම වැනි ආගමික කාර්යය සඳහා ප්‍රමුඛ අවධානය යොමු කිරීම හේතුවෙන් පවුලේ දෛනික ආහාර අවශ්‍යයතාවන් සපුරාලීමට ඔහුහට නොහැකි වේ. දරුවන් කුඩා වයසක පසුවන බැවින් ඔවුනට ද එම කාර්යය කල නොහැකි ය. එවිට එම කර්තව්‍යය ඉටු කරලීමට සිදුවනුයේ බිරිඳවන මන්ද්‍රි දේවිය හටය. පවුලක පුරුෂයා විසින් සම්ප්‍රදායිකව ඉටු කළ ප්‍රමුඛ වගකීමක් ස්ත්‍රිය විසින් සිදු කරනු ලැබූ බවට සාධක මෙම සිතුවම් මඟින් පිළිබිඹු වන බව මෙයින් පෙන්වා දිය හැකිය.

කාන්තාවෝ විවිධ ලෞකික උත්සව සඳහා දැක්වූ දායකත්වය ඇසුරින් ද ස්ත්‍රිය පිළිබඳ සමාජ ආකල්ප අධ්‍යයනය කළ හැකිය. දරුවන්ට නම් තැබීමේ උත්සවයේ දී ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂයින්ට වඩා වැඩි කාර්යයන් පැවරී ඇත. මෙහිදී පවුලේ වැඩිමහල් පිරිමි පුද්ගලයා (සීයා හෝ පියා) විසින් දරුවාගේ නම් තැබීම සිදු කරනු ලැබේ (නොක්ස්, 1681; ෆෝර්බ්ස්, 1841). එමෙන් ම අවමංගල්‍යය උත්සව අවස්ථාවල දී ස්ත්‍රියගේ කාර්යයන් බිතුසිතුවම් ඇසුරින් හඳුනා ගත හැකිය. අවමංගල්‍යය චාරිත්‍ර සිදු කිරීමේ දී පුරුෂයින් පමණක් සහභාගී වී ඇත (ඩේවි, 1821; කෝර්ඩිනර්, 1807). දුම්බර ප්‍රදේශයෙහි පමණක් කාන්තාවන් මිනිය රැගෙන යන බව වැඩිදුරටත් ජෝන් ඩේවි සඳහන් කරනු ලැබේ. උරග ජාතකය නිරූපිත සිතුවමෙහි අවමංගල්‍යය කටයුතු පියා විසින් පමණක් ඉටු කිරීමත් බුද්ධ පරිනිර්වානයේ දී දේහය රැගත් පෙරහැරෙහි කාන්තාවන් නොදැක්වීමත් අවධානය යොමු කළ යුතු වැදගත් සාධක ය. ජාතක කතාවට අනුව නිවැසි කාන්තාවන්හට අවමංගල්‍යයට පැමිණිය යුතු ආකාරය ව්‍යංගයෙන් ගොවියා ප්‍රකාශ කරනු ලැබේ. කතාවට අනුව පවුලේ සැවොම අවමඟුල සඳහා සහභාගී වේ. එයට අනුව කාන්තාවෝ දිය නා, පිරිසිදුවී, ඇඳුම් හැඳ, සුවඳ විලවුන් සහ මල් රැගෙන පැමිණිය යුතු ය. සිතුවම්වල කාන්තාවන් නිවසේ සිටින විට උඩුකය නිරුවත්ව සිටින අතර (රූපය 10) ඔවුන් කුඹුරට යන විට, වංශවත් කතුන් (ගොවි බිරිඳ සහ තවත් කාන්තාවක්) උඩුකය වැසෙන සේ ඇඳුමින් සැරසී කුඹුරට යනු ලැබේ (රූපය 06). නමුත් අවමංගල්‍යය චාරිත්‍ර සිදු කරනු ලබන අවස්ථාවේ දී ගොවියා පමණක් නිරූපණය කර ඇත. කාන්තාවන් මෙලෙස අලුත් ඇඳුමකින් සැරසී කුඹුරට යෑම මඟින් ඔවුන් අවමංගල්‍ය කටයුතු සූදානම් කිරීම සඳහා දායක වූ බව හැඟවේ (කරුණාරත්න, 2018). නමුත් චිත්‍රවල ගොවියා පමණක් අවමංගල්‍යය කටයුතු සඳහා සහභාගි වන ආකාරය නිරූපණය කර ඇත. මහනුවර යුගයේ දී කාන්තාවෝ අවමංගල්‍ය කාර්යයන් සඳහා සහභාගි නොවුනේ ද යන ගැටලුව මෙහි දී ඉස්මතු වේ. මරණය වැනි ලෝක ධර්මතාවන් කාන්තාවන් හට තේරුම් ගැනීමට නොහැකි බැවින් ඔවුන් අවමංගල්‍යය චාරිත්‍රවලදී සිතුවම් කර නොපෙන්වූවා ද යන අදහස කරුණාරත්න වැඩිදුරටත් ඉස්මතු කර දක්වනු ලැබේ.

"18 සහ 19වන සියවස්වල මහනුවර ශෛලියේ සිතුවම්වලින් මානව සමාජයේ ඇති සමානාත්මතාව නිරූපණය වේ" (සෙනෙහෙවීර, 2011, p. 3). ස්ත්‍රියට නිවසේ කාර්යයන් පමණක් නොව විනෝදාස්වාදය සැපයීම වැනි කාර්යයන් සඳහා ද අවකාශය හිමිව ඇති බව මහනුවර යුගයට අයත් පහතරට සිතුවම්වලින් සාධක හමුවේ. නොක්ස් (1681) සඳහන් කරන පරිදි කඩු රැගෙන පෙරහැරක ක්‍රීඩාවක යෙදෙන ස්ත්‍රියක් පිළිබඳව සඳහන් වේ. තොටගමුව තෙල්වත්ත සහ මිරිස්ස සමුද්‍රගිරි විහාරයෙහි රබන් වයමින් නටමින් සිටිනා කාන්තාවන් මඟින් ඔවුන් ලැබූ නිදහස් ජීවන පරිසරය නිරූපණය වේ. නමුත් ඉහත සඳහන් කළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතා සංකල්ප වෙනස්ව මහනුවර අවදියේ සමාජයෙහි පැවති බවට ද සාධක ඇත. පූර්වයෙන් සඳහන් කළ මුල්කිරිගල විහාරයේ තේලපත්ත ජාතකයෙහි කාන්තා චරිතය වෙස් මුහුණක් පැළඳගත් පුරුෂයෙකු විසින් රඟ දක්වනු ලැබීමට හේතුව මෙහිලා විමසිය යුතුය. මෙවන් සාම්ප්‍රදායික නැටුම් සඳහා ස්ත්‍රී චරිත නිරූපණයට පුරුෂයින් පමණක් භාවිතය ස්ත්‍රීන් සාම්ප්‍රදායිකව මෙම සංස්කෘතික කාර්යය සඳහා සහභාගී නොවුණු බවට මනා නිදසුනකි. එකළ පුරුෂ කේන්ද්‍රීයව සමාජයේ කාර්යයන් ගොඩනැගී තිබීම මෙයට හේතු පාදක වන්නට ඇත.

මේ අනුව අතීත මහනුවර ජන සමාජයෙහි ස්ත්‍රියගේ වගකීම් සහ අයිතිවාසිකම් අනාවරණය කර ගැනීම සඳහා කළ අධ්‍යයනයේ දී හඳුනාගත් කරුණු පහත පරිදි පෙළ ගැස්විය හැකි ය.

☛. බෞද්ධාගමික කතා වස්තු එක් ප්‍රධාන පුරුෂ කේන්ද්‍රීය චරිතයක් (බෝධිසත්වයන් හෝ බුදුන් වහන්සේ) වටා ගොඩ නැගී ඇති බැවින් ස්ත්‍රියට පැවරී තිබූ සමාජ වගකීම් සහ කාර්යයන් නිරූපණයට සුවිශේෂ අවධානයන් චිත්‍ර ශිල්පියා විසින් යොමු කර නැත.

☛☛. ස්ත්‍රිය මවක සහ බිරිඳක ලෙස සැමියාගේ කාර්යයන්වලට සහාය වීමත්, දරුවන් රැක බලා පෝෂණය කරලීමත් සැමියා සමඟ සහයෝගයෙන් සිදු කර ඇත.

☛☛☛. ලෞකික සමාජයේ රාජ්‍ය පාලනය හෝ ගෘහ මූලිකත්වය දැරීම වැනි කාර්යයන්වලදී කාන්තා මැදිහත් වීම් සීමාසහිත වුවත් පහතරට සම්ප්‍රදායේ සිතුවම් අනුව කාන්තාවට පහතරට යටත්විජිත සමාජය තුළ වඩා නිදහස් ජීවන අවස්ථා හිමිව තිබී ඇත.

**නිගමනය**

විහාර සිතුවම්වල වස්තුවිෂය ලෙස බුද්ධ චරිතය හෝ ජාතක කතා බොහෝ අවස්ථාවලදී පාදක කරගෙන ඇත. එහිදී ස්ත්‍රියගේ සමාජීය වටිනාකම් ඉස්මතු කර දැක්වීම සිදුකර ඇත්තේ අල්ප ලෙස ය. එම කතාවල කේන්ද්‍ර චරිතය පුරුෂයකු වීම එයට ප්‍රධාන හේතුව විය හැකි ය. ස්ත්‍රිය පිළිබඳ පැවති සමකාලීන සමාජ ආකල්ප බිතුසිතුවම් ඇසුරින් තේරුම් ගැනීම සඳහා මහනුවර යුගයේ විදේශීය ලේඛකයන් රචිත සමකාලීන ලේඛන ද්විතියීක මූලාශ්‍ර ලෙස අධ්‍යයනය වඩාත් යෝග්‍යය වේ. විහාර සිතුවම්වලදී කුල භේදයකින් තොරව ස්ත්‍රියක මාතෘත්වයට පත්වීම ඇය ජීවිතයේ මුහුණ දෙන උසස් ජීව විද්‍යාත්මක කාර්යයක් ලෙස ඉස්මතු කර ඇත. එලෙසම ගෘහණියක වශයෙන් දරුවන් පෝෂණය කිරීම සහ සැමියාගේ කාර්යන් සඳහා සහභාගි වීම සිදුකරනු ලබන ආකාරය විහාර සිතුවම්වලින් නිරූපණය වේ. අවමංගල්‍ය වැනි විවිධ සමාජ උත්සව අවස්ථාවලදී පුරුෂදායකත්වය කැපී පෙනෙන අතර ස්ත්‍රී දායකත්වය සිතුවම්වල දී ඉස්මතු කරලීම සිදුව නොමැත. නමුත් උඩරට ශෛලියේ සිතුවම්වලට වඩා පහතරට සම්ප්‍රදායේ සිතුවම්වලදී ස්ත්‍රිය ගෘහාශ්‍රිත කාර්යයන්වලට පමණක් සීමා වූ චරිතයකට වඩා යටත් විජිතකරණය හමුවේ වඩා නිදහස් ජීවන රටාවක් ගත කරනු ලබන ආකාරය හඳුනාගත හැකිය. මහනුවර සමාජයේ ස්ත්‍රිය පිළිබඳව සමාජයේ පැවති ආකල්ප පිළිබඳව සමකාලීන විහාර බිතුසිතුවම් පාදකව තවදුරටත්

පර්යේෂණ සිදු කළ යුතුව ඇත. එමගින් ස්ත්‍රිය පිළිබඳව වූ සමාජ ආකල්ප තවදුරටත් අනාවරණය කර ගැනීමට අවකාශය ලැබේ.



රූපය 01ඃ ගර්භනී මහමායා දේවිය, බුද්ධ චරිතයේ අවස්ථාවක්, කතළුව පූර්වාරාමය, ගාල්ල, 19වන සියවස පසු අවදිය



රූපය 02ඃ ගර්භනී පටාචාරාව, බුද්ධ චරිතයේ අවස්ථාවක්, කතළුව පූර්වාරාමය, ගාල්ල, 19වන සියවස පසු අවදිය



රූපය 03ඃ වෙස්සන්තර රජු සහ බිසව දරුවන් සමඟ, වෙස්ස්න්තර ජාතකය, අරත්තන රජ මහා විහාරය, හඟුරන්කෙත, 18වන සියවස පසු අවදිය



රූපය 04ඃ වෙස්සන්තර රජු දරුවන්ට ආහාර කැවීම, වෙස්ස්න්තර ජාතකය, කැලණිය රජ මහා විහාරය, කැලණිය, 19වන සියවස පසු අවදිය



රූපය 05ඃ ගොවියා සීසෑම, උරග ජාතකය, මැදවල ටැම්පිට විහාරය, මැදවල, ක්‍රි.ව. 1755



රූපය 06ඃ ආහාර රැගෙන කුඹුරට යන, උරග ජාතකය, මැදවල ටැම්පිට විහාරය, මැදවල, ක්‍රි.ව. 1755



රූපය 07ඃ, මන්ද්‍රී දේවිය, උරග ජාතකය,
මැදවල ටැම්පිට විහාරය, මැදවල, ක්‍රි.ව. 1755



රූපය 08ඃ ගොවියා අවමංගල්‍යය කටයුතු පිළිලෙ කිරීම, උරග ජාතකය,
මැදවල ටැම්පිට විහාරය, මැදවල, ක්‍රි.ව. 1755



රූපය 09ඃ බුදුන්වහන්සේගේ දේහය රැගත් අවමංගල්‍යය පෙරහැර, බුද්ධ චරිතය,
නවමුණීසෑ විහාරය, කතළුව, ක්‍රි.ව. 19වන සියවස



රූපය 10ඃ නිවසෙහි සිටින කාන්තාවෝ, උරග ජාතකය, මැදවල ටැම්පිට විහාරය, මැදවල, ක්‍රි.ව. 1755



රූපය 11ඃ ආහාර රැගෙන කුඹුරට යන කාන්තාවෝ, උරග ජාතකය, මිනිගමුව ටැම්පිට විහාරය, තුම්පනේ, ක්‍රි.ව. 18-19 සියවස



රූපය 12ඃ සංගීත භාණ්ඩ වයන කාන්තාවෝ, තොටගමුව තෙල්වත්ත විහාරය, 19වන සියවස



රූපය 13ඃ දෙව්ලොව සංගීත භාණ්ඩයක් වයන කාන්තාවක්, සමුද්‍රගිරි විහාරය, මිරිස්ස, 19වන සියවස

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

ජයතිලක, වී. එන්. (2022). *ශ්‍රී ලංකාවේ විහාර සිත්තරු (ක්‍රි.ව. 1750-1900).* නුගේගොඩ ඃ සරසවි ප්‍රකාශකයෝ.

මහින්ද හිමි, යූ. (2016). *දකුණේ විහාරවල මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර.* කොළඹ 10ඃ සී/ස ඇස්. ගොඩගේ

සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

රත්නායක, ඩී. (2009). *මහනුවර චිත්‍ර සම්ප්‍රදාය සහ සමාජය.* එල්ලක්කල: සුරමා ප්‍රකාශන.

විජේවර්ධන, පී.ඇස්. (2004). *ලංකාවේ පනස් වසරක් (Fifty Years in Ceylon).* කොළඹ 10: ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්.

සෝමතිලක, එම්. (2004). *පුරාතණ ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Bandaranayake, S. (2006). *The rock and wall paintings of Sri Lanka*. Colombo: Lake House Book Shop.

Hawker, S. (Ed.). (2015). *Little Oxford English Dictionary* (9th ed.). New Delhi: Oxford University Press.

Knox, R. (2016). *An historical relation of the island of Ceylon* (D. Karunarathna, Trans.).
Glasgow: Jackson, Son and Company. (Original work published 1681)

වෙබ් අඩවි

හරීජා, එම්. එෆ්. එන්. සහ වංසවතී, එල්. එම්. (n.d.). *අංක17 - අන්තර් පුද්ගල සම්බන්ධතා සහ ආකල්ප කුසලතා සංවර්ධනය.* Retrieved April 27, 2025, from https://www.zonedimbu.lk/download/module/m17.pdf

Cordiner, J. (1807). *A description of Ceylon: Containing an account of the country, inhabitants and natural productions*. Available at https://archive.org/details/adescriptioncey01cordgoog1o49

Davy, J. (1821). *An account of the interior of Ceylon and its inhabitants*. Available at https://www.google.lk/books/edition/An_Account_of_the_Interior_of_Ceylon_and/1ssNAAAAQAAJ?hl=en&gbpv=1

Ecesu. (2025, March 24). *How to analysis a painting with Panofsky's iconological method*. The History Corner. https://www.thehistorycorner.org/articles-by-the-team/how-to-analysis-a-painting-with-panofskys-iconological-method

Hawker, S. (Ed.). (2015). *Little Oxford English Dictionary* (9th ed.). New Delhi: Oxford University Press.

Jayawardena, J. (2002). *Cultural construction of the 'Sinhala women' and women's lives in post-independence Sri Lanka* (PhD thesis, University of York). Retrieved from https://etheses.whiterose.ac.uk/14014/

Karunarathna, D. (2015). *Imaging the role of women in changing socio-cultural contexts: A study of female representations in murals in pre-modern Sri Lanka* (PhD thesis, Newcastle University). Retrieved from https://theses.ncl.ac.uk/jspui/handle/10443/2915

Karunarathna, D. (2018). Gender ideology and (re)contextualization of Uraga Jataka painting as depicted in Madawala Temple, Sri Lanka. *Social Affairs: A Journal for the Social Science, 1*(8), 10–27. Retrieved from https://www.academia.edu/44963426/GENDER_IDEOLOGY_AND_RE_CONTEXTUALIZATION_OF_URAGA_JATAKA_PAINTING_AS_DEPICTED_IN_MEDAWALA_TEMPLE_SRI_LANKA

Karunarathna, D. N. (2021). Facets of motherhood visualized in Sri Lankan temple murals. *Canadian Journal of Buddhist Studies*, 115–169. Retrieved from https://www.academia.edu/67865412/Facets_of_Motherhood_Visualized_in_Sri_Lankan_Temple_Murals

Labadi, S., Giliberto, F., Rosetti, I., Shetabi, L., & Yildirim, E. (2021). *Heritage and the Sustainable Development Goals: Policy guidance for heritage and development actors* (ICOMOS Sustainable Development Goals Working Group). International Council on Monuments and Sites. (Original work published 2021)

Liyanage, D. (2016). *The influence of folk poetry on the process of developing personal attitudes:Special reference to folk poems of Manewa village in Anuradhapura district*. Udyaprabha, *Vidyodaya University of Sri Jayewardenepura*, pp. 167–173. Retrieved April 25, 2025, from https://www.researchgate.net/publication/304476574_The_Influence_of_Folk_Poetry_on_the_Process_of_Developing_Personal_Attitudes_Special_Reference_to_Folk_Poems_of_Manewa_Village_in_Anuradhapura_District

Prasanna, S.U.C. (2022, September). Men's attitude towards gender stereotypes in Sri Lanka. Paper presented at the *1st National Conference on Gender*, University of Kelaniya. Retrieved from https://www.researchgate.net/publication/375988631_Men%27s_Attitude_towards_Gender_Stereotypes_in_Sri_Lanka

Prasanna, S.U.C. (2023, July). A debate on achievement of gender equality in Sri Lanka by 2030. Paper presented at the *2nd National Conference on Disparities*, Hotel Ramada. Retrieved from https://www.researchgate.net/publication/375987767_A_Debate_on_Acheivment_of_Gender_Equality_in_Sri_Lanka_by_2030

Premaratne, L.D.M., Nishanthi, M., & Neththesinghe, N.M. (2022). Understanding social construction of the Kandyan period. *Journal of Intangible Cultural Heritage, 1*(2), 86–97. Retrieved from http://dr.lib.sjp.ac.lk/bitstream/handle/123456789/12596/final%20full%20vol%20(1)-090-101.pdf?sequence=1

Seneheweera, L. (2011, May 12–14). The harmonious Buddhist society in ancient Sri Lanka as depicted on Kandyan Buddhist paintings. In *Proceedings of the 8th Conference of the United Nations Day of Vesak* (pp.1–9). Ayutthaya, Thailand: UN-DVD Day of Vesak. Retrieved from https://www.undv.org/vesak2011/panel2/16SeneheweeraFINAL.pdf

Sirr, H.C. (1850). *Ceylon and the Singhalese*. Retrieved from https://archive.org/details/ceyloncingaleset01sirr

United Nations Development Programme. (n.d.). *Gender equality (Sustainable Development Goal 5)*. In *Sustainable development goals*. UNDP. Retrieved July 31, 2025, from https://www.undp.org/sustainable-development-goals/gender-equality

Wijesekara, N. D. (1949). *The people of Ceylon*. https://archive.org/details/dli.ernet.6230